**මිනිපේ ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රිකය**
-----------------------

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 18 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුලි 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ දී ප්‍රජා ජල ව්‍යාපෘතියෙන් සභාව වෙත ලැබී සභාවේ භාවිතයේ පවතින රු.172,990 ක් වටිනා CP MO-4995 හා CP MO-5001 දරන යතුරු පැදි 02 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර ද නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ එකතුව රු.15,240 ක් වූ පුස්තකාල සාමාජික බඳවා ගැනීමේ ගාස්තු හා සාමාජිකත්ත්වය අලුත් කිරීමේ ගාස්තු වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව පොදු තැන්පතු යටතේ දක්වා තිබුණි.

#### 1.3.2 අවිනිශ්චිත ගිණුම්.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.13,369 ක් වූ ශේෂය පිළිබඳව සොයා බලා, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.3.3 ලැබියයුතු ගිණුම්.

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 10 ක එකතු වටිනාකම රු.67,280,370 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.5,155,958 ක් වී තිබුණි.

#### 1.3.4 ගෙවියයුතු ගිණුම්.

2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.62,720,988 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.62,372,907 ක් කර්මාන්ත ණයහිමියෝ වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ කර්මාන්ත ණයහිමි වටිනාකම රු.2,250,333 ක් විය.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**-----------------------------------**

ගිණුම් විෂයයන් 04 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.52,014,084 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

**---------------------------------------------------**

පහත සඳහන් නීති, රිති හා රෙගුලාසීවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පාරිපාලන) රීති මාලාව.<br>------------------------------------ | |
| | 177 හා 178 වගන්ති. | ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව රු.7,616,231 ක් වටිනා කර්මාන්ත 30 ක ඉදි කිරීම් ප්‍රජා සංවිධානවලට පවරා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසී සංග්‍රහය.<br>------------------------------------------- | |
| | මු.රෙ.571(2 | 2014 දෙසැම්බර් 31 දිනට අවස්ථා 06 කට අදාළ රු.42,674 ක ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,784,629 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,059,656 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,275,027 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

**2.2 ආදායම් පරිපාලනය.**

**----------------------**

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.8,809,019 ක් හිඟ ආදායම් ශේෂයක් විය.

**2.2.1 වරිපනම් බදු**

**--------------**

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.443,421 ක ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.530,335 ක් විය. එම ශේෂවලින් වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය පිළිවෙළින් සියයට 18 ක් හා සියයට 69 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂය අවසානයට රු.530,183 ක හිඟ ශේෂයක් පැවති නමුත්, ඒ සඳහා ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා 159(1) වගන්ති ප්‍රකාරව හිග ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 බදු කුළී.**

------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.1,489,568 ක ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.989,999 ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය පිළිවෙළින් සියයට 13 ක් හා සියයට 24 ක් වූයෙන්, 2014 දෙසැම්බර් 31 දිනට රු.2,277,456 ක හිග ශේෂයක් පැවතුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේද දි සියයට 53 වර්ධනයක් විය.

**2.2.3 ජල ගාස්තු.**

-----------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.1,879,022 ක හිඟයක් පැවති අතර, වර්ෂය තුළ හිඟ ශේෂයෙන් අය කිරීම සියයට 49 ක තරම් දුර්වල මට්ටමක පැවතුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,153,106 ක හිඟ ශේෂයක් පැවතින.

**2.2.4 මුද්දර ගාස්තු.**

-------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.268,400 ක් අය ලැබිය යුතුව පැවතුණි. එම මුදලින් 2015 ජූලි 31 දින වන විට රු.80,820 ක මුදලක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

-------------------------------------

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.61,987,740 ක තාවකාලික තක්සේරුවක් මත ගිණුම්ගත කළ ඉඩම් හා ගොඩනැගිලි 66 ක් සම්බන්ධව විධිමත් තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.623,957 ක් වටිනා ජංගම වත්කම් ශේෂයන් 03 ක් සහ ජංගම වගකීම් ශේෂ 02 ක් වර්ෂ 04 සිට 12 දක්වා කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර, මෙම ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මොරයාය පුස්තකාලය සඳහා ආරක්ෂිත බැම්මක් හෝ වැටක් නොමැතිවීම හේතුවෙන්, පුස්තකාල පරිශ්‍රය තුළ අනවසර ඉදි කිරීම් කර ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) මිණිපේ 07 කණුව සති පොළ භූමිය සඳහා ආරක්ෂිත වැටක් හෝ මායිම් ලකුණු කර නොතිබු අතර, ඒ තුළ අනවසර ස්ථිර ගොඩනැගිල්ලක් ඉදි කර තිබුණි. එම ගොඩනැගිල්ල සඳහා විදුලි සම්බන්ධතාවයක් ලබා ගෙන තිබුණු අතර, එසේම, සති පොළ ආසන්නයේ පිහිටි නිවාස 02 ක් සඳහා වෙනත් ප්‍රවේශ මාර්ගයන් තිබිය දී පොළ භූමිය හරහා ප්‍රවේශ මාර්ගයක් භාවිතා කිරීමට ඉඩකඩ සළසා තිබුණි. පොළ භූමිය මධ්‍යයෙහි විදුලි රැහැන් කණුවක් අලුතින් ස්ථාපිත කර, එයින් නිවාස 02 ක සඳහා විදුලිය ලබා ගැනීමට උපයෝගී කර තිබුණි.

(ඉ) ජල පාරිභෝගිකයින් 1568 කින් පමණ සමන්විත සභාව සතු ජල යෝජනා ක්‍රම 12 ක් මගින් සමාලෝචිත වර්ෂයේ රු.2,340,300 ක ආදායමක් උපයා ගෙන තිබුණි. ජල මූලාශ්‍රයන්ගෙන් ලබා ගන්නා ජලය, පිරිසිදුකාරකයක් යොදා පිරිසිදු කිරීමකින් හෝ පෙරණයක් භාවිතා කිරීමනින් තොරව කෙළින්ම ජල ටැංකි තුළට ජලය ලබා ගෙන ජල පාරිභෝගිකයින් වෙත බෙදා හැරීම සිදු කර තිබුණි. ජලයට කුඩා සතුන්ගේ මළමළකුණු හා වෙනත් අප ද්‍රව්‍ය එක් වීමෙන් ජලය අපවිත්‍ර වන අතර ජලය පිරිසිදු කිරීම සඳහා කිසිදු ක්‍රම වේදයක් අනුගමනය කිරීමකින් තොරව ජල

පාරිභෝගිකයින් වෙත ජලය බෙදා හරින බව 2015 ජුලි 16 දින කරනලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

---

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.2,110,950 ක් වූ වාහන 04 ක් වර්ෂයකට වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

---

**4.1 සංයුක්ත සැලැස්ම**

---

සමාලෝචිත වර්ෂයේ දී සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

---

රු.35,255,547 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 ක්‍රියාකාරී සැළැස්ම.**

---

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු.**

---

සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත නොකිරීම හේතුවෙන් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.5 අභ්‍යන්තර විගණනය.**

---

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.6 අයවැය පාලනය.**

---

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසදීමේ දි ආදායම් විෂයයන් 04 ක සියයට 15 සිට සියයට සියය ඉක්මවා ද, වියදම් විෂයයන් 05 ක සියයට 15 සිට සියයට 95 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.** **පද්ධති හා පාලන.**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය